**බැංකු පනත් විධාන 2018 අංක 06** 2018 සැප්තැම්බර් 28

## මෝටර් රථ වාහන ආනයනය සීමා කිරීමේ ක්‍රියාමාර්ග

1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 46(1) සහ 76(ඒ)(1) යන වගන්ති ප්‍රකාරව නිකුත් කරන ලදී.

ආනයන සහ එමගින් විනිමය අනුපාතයට ඇති වන අහිතකර බලපෑම සීමා කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා 2018 ඔක්තෝබර් 01 සිට බලපැවැත්වෙන පරිදි පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලෙස දන්වා සිටී.

1. 2018 අංක 01 දරන මෝටර් රථ සම්බන්ධ වටිනාකම මත ණය පහසුකම් පිළිබඳ බැංකු පනත් විධානයෙහි 2.1 විධානය පහත පරිදි ආදේශනය කරන ලදී.

   නැවත දැනුම් දෙන තෙක්, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මෝටර් රථ මිලදී ගැනීම හෝ භාවිතය සඳහා ලබා දෙන ණය පහසුකම් එම මෝටර් රථවල වෙළඳපොළ වටිනාකමින් පහත ප්‍රතිශතයන් නොක්මවිය යුතුය.

   (i) පළමු ලියාපදිංචි දින සිට වසරකට අඩු කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිතා කර ඇති ලියාපදිංචි කළ වාහන සහ ලියාපදිංචි නොකළ වාහන සඳහා

**වගුව - 01 - වටිනාකම් මත ණය අනුපාතය**

| වාහන කාණ්ඩය | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වර්ගීකරණය | විද්‍යුත් මෝටර් රථ | වෙනත් |
|---|---|---|---|
| වාණිජ වාහන | C1, C, CE, D1, D, DE, G1, G, J | 90% | 90% |
| මෝටර් කාර්<br>ක්‍රීඩා උපයෝගීතා වාහන (SUVs)<br>සහ වෑන් රථ | B (සැහැල්ලු ලොරි සහ ඒකල කැබ් රථ හැර) | 90% | 50% |
| ත්‍රීරෝද රථ | B1 | 90% | 25% |
| අනෙකුත් මෝටර් රථ | A1 A, සැහැල්ලු ලොරි හා B කාණ්ඩය යටතේ වර්ගීකරණය කර ඇති ඒකල කැබ් රථ | 90% | 70% |
| දෙමුහුන් මෝටර් කාර්, වෑන් රථ සහ ක්‍රීඩා උපයෝගීතා වාහන (SUVs) | B (සැහැල්ලු ලොරි සහ ඒක කැබ් රථ හැර) | 50% | |

   (ii) පළමු ලියාපදිංචි දින සිට වසරකට වැඩි කාලයක් ශ්‍රී ලංකාවේ භාවිතා කර ඇති ලියාපදිංචි කළ වාහන සඳහා 70%

2. සහනදායී පදනම මත මෝටර් රථ ආනයනය කිරීමට ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කළ බලපත්‍ර සඳහා මෝටර් රථ ආනයනය සඳහා ණයවර ලිපි විවෘත කිරීම නැවත දැනුම් දෙන තුරු සිදු නොකළ යුතුයි.

අත්සන් කළේ,
ආචාර්ය පී.එන්. වීරසිංහ
**ප්‍රධාන විධායක නිලධාරී සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ**
**ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති**